VERITÉ RESEARCH
Strategic Analysis for Asia

5 POLICE PARK PLACE, COLOMBO 05, SRI LANKA
TEL: + 94 112055544; FAX: +94 719379567
EMAIL: RECEPTION@VERITERESEARCH.ORG

# නිලධාරි අභිමතයට හසුවී ඇති සිගරට් මිල ගණන්

ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් දුම්කොළ සඳහා පනවන ලබන බදු ඉහළ නැංවීම තුළින් එහි මිල ඉහළ දැමීමට සහ එමගින් පරිභෝජනය අඩු කිරීම සඳහා රාජ්‍යයන් පෙළඹවීමට විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ. මෙම විශ්ලේෂණය මගින් ශ්‍රී ලංකාව දුම්කොළ සඳහා බදු පැනවීමේදී හා එහි මිල ගණන් නියම කිරීමේදී දක්වනු ලබන ප්‍රතිපත්තිමය අස්ථිරතාවයන් පිළිබඳව කරුණු ඉදිරිපත් කෙරේ.

ශ්‍රී ලංකානු වෙළඳපොල තුළ බීඩි, බුලත් වැනි විවධාකාර වූ දුම්කොළ පරිභෝජනයන් ප්‍රචලිතව පවතී. මේ පිළිබඳව විශ්වාසදායක දත්ත සොයා ගැනීම දුෂ්කර වේ. ශ්‍රී ලංකාවේ දුම්කොළ සමාගම (Ceylon Tobacco company) සහ මත්පැන් සහ මත්ද්‍රව්‍ය පිළිබඳ තොරතුරු මධ්‍යස්ථානය - (Alcohol and Drug Information Centre) විසින් සිදුකරන ලද පර්යේෂණ වල ප්‍රතිඵල වල ද විශාල වෙනස්කම් පවතී. කෙසේ වුවත් ශ්‍රී ලංකාව තුළ දුම්කොළ පරිභෝජනය සම්බන්ධව ඉහළම ස්ථානයේ රැඳී සිටීමට සිගරට් සමත් වී ඇත (බීඩියක ඇති දුම්කොළ ප්‍රමාණය සිගරට්ටුවකට සාපේක්ෂව ඉතා අඩු අගයක් ගනී).

ශ්‍රී ලංකාවේ සිගරට් නිෂ්පාදනය සහ විකණීම සම්බන්ධයෙන් ඒකාධිකාරයක් පවති. ශ්‍රී ලංකා රජය දුම්කොළ සම්බන්ධ බදු නියාමනයකට අමතරව සිගරට් වල මිල ගණන් නියම කිරීම සම්බන්ධව ද (1989 අංක 13 දරන සුරා බදු පනතේ (විශේෂ විධි විධාන) 3 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව) කටයුතු කරයි. මේ අනුව ප්‍රතිශතාත්මක අගයක් ලෙස බදු නියම කිරීම වෙනුවට රුපියල් අගයෙන් බදු නියම කිරීම තුළින් සිගරට් මිල සම්බන්ධව ඍජු පාලනයක් පවත්වාගෙන යාමට ශ්‍රී ලංකා රජයට හැකියාවක් පවතී.

නමුත් පසුගිය කාලය තුළ සිගරට් සම්බන්ධව පැනවූ බදු සහ මිල ගණන් දෙස අවධානය යොමු කිරීමේදී පෙනී යන්නේ එහි ප්‍රබල ගැටළු සහගත ස්වභාවයක් පවතින බවත් මිල තීරණය කිරීම් දේශපාලනික සහ නිලධාරිවාදයෙහි අතකොළුවක් වී ඇති බවත් ය.

**ශ්‍රී ලංකාවේ සිගරට් මිල ගණන් නියම කිරීම සහ බදු අය කිරීම පිළිබඳ ගැටළුව එක් වචනයකින් ලඝු කොට දැක්විය හැකිය : අභිමතය**

සිගරට් මත පනවා ඇති සුරා බදු මගින් 2013 දී ශ්‍රී ලංකා රජයට වාර්ෂිකව රුපියල් බිලියන 58ක පමණ ආදායමක් ලැබුණි. මෙය රජයේ සමස්ත ආදායමෙන් 5%ක පමණ ප්‍රතිශතක අගයක් ගනී. සිගරට්ටුවක නිෂ්පාදන පිරිවැය රු. 1ක් පමණ වන අතර බොහෝ සිගරට් වර්ග වෙළඳපොල තුළ සාමාන්‍යයෙන් රු. 28ක පමණ මිලකට අලෙවි කෙරේ. මේ අනුව සිගරට්ටුවක මිල හෝ බදු ප්‍රමාණය රුපියල් කිහිපයකින් වෙනස් කිරීම මගින් රාජ්‍යය ආදායම ද රුපියල් බිලියන ගණනකින් වෙනස්කර

ගත හැක. නමුත් මුදල් අමාත්‍යාංශය, රාජ්‍යය භාණ්ඩාගාරය හෝ මහ බැංකුව වැනි ප්‍රධාන මූල්‍ය ආයතන වලින් කිසිවක් සිගරට් මිල ගණන් නියම කිරීම සම්බන්ධව එක ක්‍රමවේදයක් හෝ බදු සඳහා සමීකරණයක් අනුගමනය කර නොමැත.

ආර්ථික විද්‍යාත්මක පර්යේෂණ මගින් ප්‍රතිපත්තිමය හා නියාමනයේ ඉහළ මට්ටමේ සිටින පුද්ගලයින්ට ප්‍රතිපත්තිමය හා නියාමන තීරණ තුළින් ලාභ ප්‍රයෝජන ලබාගත හැකි බව පෙන්වා දී ඇත. ඒ අනුව ඉහළ මට්ටමේ සිටින නිලධරයන් ක්‍රියාත්මක කරන ප්‍රතිපත්ති සහ නියාමනයන් හි දුර්වලතා අභියෝගයට ලක් කරනු වෙනුවට ඒවා ඒ ආකාරයෙන්ම පවත්වාගෙන යාමට මෙම ලාභ ප්‍රයෝජන තුළින් අනුබල ලැබේ.

මේ අනුව ශ්‍රී ලංකාවේ සිගරට් මිල සහ බදු තීරණය කිරීම සම්බන්ධව පවතින ගැටළුව එක් වචනයකින් ලසුකොට දැක්විය හැකිය. 'අභිමතය'. එනම් ප්‍රතිපත්ති හා නියාමනයේ යෙදෙන ඉහළ නිලධරයන් ඒ පිළිබඳව දරන අභිමතය යි.

**අභිමතය හා අයථා භාවිතයට ඇති ඉඩකඩ**

සිගරට් මිල ගණන් හා බදු නියම කිරීම සම්බන්ධ නිලධරයන්ගේ අභිමතය ආර්ථිකයට විශාල පිරිවැයක් විය හැක. එනම් රාජ්‍යය භාණ්ඩාගාරයට මෙන්ම සමාජයටද එමගින් විශාල බලපෑමක් සිදුවේ. මෙම නිලධාරි අභිමතය අනිසි භාවිතයේ යෙදීම ශ්‍රී ලංකා දුම්කොළ සමාගමට වාසි සහගත වන අතරම එය නිසි භාවිතයේ යෙදීම මගින් දුම්කොළ සමාගමට අවාසිදායක තත්ත්වක් ඇති වේ. සාධාරණ හා පාරදෘෂ්‍ය ප්‍රතිපත්තියක් ක්‍රියාවේ යෙදවීම තුළින් මෙවැනි අනිසි භාවිතය සඳහා ඇති ඉඩකඩ ඇහිරවිය හැක.

ශ්‍රී ලංකා රජය මෙම අභිමතය නිසි භාවිතයේ යෙදවීමට සැබෑ කැපවීමකින් යුතුව ක්‍රියාකරන බවට ද බොහෝ ඉඩකඩ තිබේ. කෙසේ වුවද මෙවැනි ප්‍රතිපත්තිමය හා නියාමන අභිමතයක් පැවතීම තුළින්ම එය අනිසි භාවිතයේ යෙදීම සඳහා ඉඩකඩ නිර්මාණය විය හැක.

පහත සඳහන් විශ්ලේෂණය මගින් සිගරට් මිල හා බදු ප්‍රතිපත්තිය මෙම අභිමතයේ ප්‍රතිඵලයක් ලෙස අනිසි භාවිතයේ යෙදුනු අවස්ථාවන් පිළිබඳව කරුණු ඉදිරිපත් කෙරේ.


**සිගරට් සඳහා බදු පැනවීමේ අක්‍රමිකතා**

සිගරට් සඳහා බදු පැනවීම ක්‍රමානකූලව සිදු නොකිරීම හේතුවෙන් රාජ්‍යය භාණ්ඩාගාරයට විශාල ආදායම් අහිමිවීම මෙන්ම ශ්‍රී ලංකා දුම්කොළ සමාගම් මෙහෙයුම් සම්බන්ධව ද අවිනිශ්චිතතාවන් ඇති කරමින් එම මෙහෙයුම් ද අනතුරේ හෙළීම සිදුවිය හැක.

පසුගිය කාලය තුළ මෙම කරුණු දෙකම විටින් විට සිදුවී ඇත. වෙළඳපොලෙහි අලෙවි වන වඩාත් ප්‍රචලිත සිගරට් වර්ග දෙකක් පවතී. එම සිගරට් වර්ග දෙක විසින් පිළිවෙළින් 83% ක සහ 11% ක වෙළඳපොල කොටසක් තමන් සතු කර ගැනීමට සමත් වී ඇත. මෙම වෙළඳ සන්නාම දෙකට අයත් සිගරට් මිලෙහි 2004 වර්ෂයේ සිට අඩංගු බදු ප්‍රතිශතයන් රූප සටහන 01 මගින් දක්වා ඇත.

මේ අනුව පෙනී යන්නේ 2004න් පසු කාලයේදී පවතා ඇති බදු ප්‍රතිශතයන් මගින් ශ්‍රී ලංකා දුම්කොළ සමාගමට වාසිදායක තත්ත්වයක් අත්පත් වී ඇති බවයි. සිගරට් A සඳහා බදු ප්‍රතිශතය 65.6% සිට 57.22% ක් දක්වා ද, සිගරට් B සඳහා මෙම ප්‍රතිශතය 65.88% සිට 59.32% දක්වා ද පහත වැටී ඇත (රූප සටහන 01).

**රූප සටහන 01 - සිගරට් මිලෙහි ඇති බදු ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස**




මූලාශ්‍රය : රාජ්‍යය දත්ත සහ වෙරිටේ රිසර්ච් විශ්ලේෂණ

මෙම කාල පරාසය තුළ බදු ප්‍රතිශතයන් ද විශාල පරාසයක වෙනස්වීම් වලට භාජනය වී ඇත. සිගරට් A සඳහා ඉහළම බදු ප්‍රතිශතය වන 65.6% 2004 දී ද අඩුම බදු ප්‍රතිශතය 48.3% 2007 සිට වර්ෂ දෙකක කාලයක් දක්වාද පවත්වාගෙන ගොස් ඇත (එනම්. බදු ප්‍රතිශතය 17% කින් පමණ අඩු වී ඇත). සිගරට් B සඳහා ඉහළම බදු ප්‍රතිශතය වන 70.9% 2006 වර්ෂයේදී ද අඩුම බදු ප්‍රතිශතය වන 58.6% 2008 වර්ෂයේදී ද වර්තා වී ඇත (වෙනස 12% ක් පමණ වේ).


### සිගරට් සඳහා මිල නියම කිරීම

**සිගරට්ටුවක නිෂ්පාදන පිරිවැය රු. 1 ක් පමණ වන අතර සාමාන්‍යයෙන් වෙළඳපොල තුළ අලෙවි වන මිල රු. 28.00 ක් පමණ වේ.**

සිගරට් මිල නියම කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කිරීම මගින් ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතයේ (ඒ.පු.ද.දේ.නි.) වැඩි වීමට සමගාමීව සිගරට් මිල වැඩි කිරීම සිදු කළ හැක. ඒ අනුව සාමාන්‍ය ආදායමේ වැඩිවීමට සාපේක්ෂව සිගරට් මිලදී ගැනීමේ හැකියාව වර්ධනය වීම පාලනය කළ හැකි වේ. වෙරිටේ රිසර්ච් ආයතනය මගින් මෑත කාලයේදී සිදුකළ පර්යේෂණයක් මගින් 1981-2000 දක්වා වන වසර 20 ක කාල පරාසය තුළ සිගරට් මිල ඉහළ යාම සහ ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදියේ සාමාන්‍ය වර්ධනය සමාන අගයක් ගන්නා ලද බව පෙන්වා දෙන ලදී.

මෙම කාලය තුළ සිදු කළ සිගරට් මිල වෙනස් කිරීම් ද විධිමත් ආකාරයකට සිදුවී නොමැත. ඇතැම් කාලයන් හිදී සිගරට් මිල වෙනස්වීම් ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයට ඉහළින් ද තවත් කාලයන් හිදී ඊට පහළින් ද පැවතී ඇත. 1997 හා 1998 යන වර්ෂ දෙක තුළ සිදුවූ මිල සංශෝධන ඌනතා (එනම් ඒ.පු.ද.දේ.නි.යේ වර්ධනයට වඩා අඩු මට්ටමක පැවතිනි) හැර අනෙකුත් කාලයන් හිදි මිල සංශෝධනයන් ඒ.පු.ද.දේ.නි.යේ වර්ධනයේ ප්‍රමාණයෙන්ම වෙනස් වී නොමැත . නමුත් 2001 සිට මෙම වෙනස්කම් වඩාත් තීව්‍ර වී ඇත (රූප සටහන 02 - අඳුරු කර ඇති ප්‍රදේශය).

**රූප සටහන 02 - සිගරට් B මිලෙහි සහ ඒ.පු.ද.දේ.නි.යේ වර්ධනය**




මූලාශ්‍රය : රාජ්‍යය දත්ත සහ වෙරිටේ රිසර්ච් විශ්ලේෂණ

නියම මිල නියම කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කරමින් ඒ.පු.ද.දේ.නි.යේ වර්ධනයට සාපේක්ෂව සිගරට් මිල ගණන් නියම කිරීම කරනු ලැබුවේ නම් 2013 දෙසැම්බර් වන විට සිගරට් B හි මිල රු. 44.53 ක් පමණ විය යුතුය. නමුත් දේශපාලන සහ නිලධාරී අභිමතය මත සිගරට් මිල නියම කිරීම හේතුවෙන් සිගරට්ටුවක සාමාන්‍ය මිල පවතින්නේ රු. 28.00 ක පමණ මට්ටමකය. මෙමගින් සිගරට් මිල නියම කිරීම සඳහා පාරදෘෂ්‍ය ක්‍රමවේදයක් අනුගමනය කිරීමේ වැදගත්කම පෙන්නුම් කෙරේ.

**පාර්ලිමේන්තු අවධානය යොමු කිරීමේ වැදගත්කම**

මෙම විශ්ලේෂණය මිගන් ඉදිරිපත් කළ දත්ත මගින් සිගරට් මිල සහ බදු තීරණය කිරීම සඳහා අනුගමනය කළ යුතු මූලධර්මයන් පවතින බවත් අතීතයේදී මිල ගණන් නියම කිරීම එම මූලධර්මයන්ට යම් සංගත බවක් දක්වා ඇති බවටත් කරුණු ඉදිරිපත් කරන ලදී.

ශ්‍රී ලංකානු ව්‍යවස්ථාව මගින් රාජ්‍යය මූල්‍යය නිසි කළමණාකරණය පිළිබඳ වගකීම පාර්ලිමේන්තුවට පවරා ඇත. සිගරට් මිල සහ බදු නියම කිරීම පිළිබඳ වර්තමාන අභිමතය දේශපාලන සහ නිලධාරී බලපෑම් මත සිදුවීම නිසා ඇතිවිය හැකි ගැටළු අවම කර ගැනීම සඳහා පාර්ලිමේන්තුවේ මැදිහත් වීම අතිශය වැදගත් වේ. මෙවැනි මැදිහත්වීම් තුළින් මිල සහ බදු නියම කිරීමට විධිමත් පාරදෘෂ්‍ය සමීකරණයක් යොදා ගැනීම තුළින් සිගරට් මිල නියමිත මට්ටමේ පවත්වාගෙන යාමට පමණක් නොව රාජ්‍යය මූල්‍යය පාලනය පිළිබඳ පාර්ලිමේන්තු වගකීම ද නිසියාකාරව ඉටු කිරීමට ද රුකුලක් සැපයේ. මේ සඳහා ඍජු සත්‍යවාදී පාර්ශවකරුවන්ගේ සහයෝගය අනිවාර්යයෙන්ම ලැබෙනු ඇත. මෙය පාර්ලිමේන්තුවට අවධිවීමට කාලයයි.

**වෙරිටේ රිසර්ච් (Verité Research) යනු රාජ්‍ය අංශයට උපාය මාර්ගික හා ප්‍රතිපත්ති සම්පාදනය සඳහා උපදෙස් ලබා දෙන සහ පෞද්ගලික අංශයට ආර්ථික විද්‍යාත්මක, නීතිමය, මාධ්‍ය හා දේශපාලනික ක්ෂේත්‍ර ඔස්සේ උපදේශණ සේවා ලබාදෙන පර්යේෂණ ආයතනයකි.**

**ඔබගේ අදහස් insights@veriteresearch.org වෙත විද්‍යුත් තැපැල් මාර්ගයෙන් යොමු කරන්න.**